# ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය - 2010

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මතය**

මාගේ පරික්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිස ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.2.1 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 අනුව සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති නමුත් තවදුරටත් ප්‍රයෝජනයට ගන්නා වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කල යුතු වුවත් එලෙස ප්‍රයෝජනයට ගන්නා වාහන 07 ක් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

1.2.2 **ගණකාධිකරණ අඩුපාඩු**

පහත සදහන් ගණකාධිකරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණන නියැදි පරික්ෂාවේදි අනාවරණය වූ එකතුව රු.148,199,683 ක් වූ ගණකාධිකරණ අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත 2011 මාර්තු 30 දිනැති කෙටුම්පත් වාර්තාවෙන් යොමුකරන ලදි . එයින් රු.6,379,688 ක් වූ ගණකාධිකරණ අඩුපාඩු නිවැරදි කර 2011මාර්තු 31 දින සංශෝධිත මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කෙරුණි. රු.141,819,995 ක ගණකාධිකරණ අඩුපාඩු නිවැරදි කර නොතිබූ අතර තවදුරටත් එවැනි අඩුපාඩු තිබීමේ ඉඩකඩ විගණනයේදි බැහැර කළ නොහැක.

(ආ) ජයසේකර ශිෂ්‍යත්ව අරමුදල හා ඊට අදාල පොලියේ එකතුව වූ රු.268,250 අරමුදල් යටතේ ගිණුම් ගත කරනු වෙනුවට□ ගෙවිය යුත ශේෂයක් ලෙස අවසාන ගිණුම් වල දක්වා තිබුණි.

(ඇ) ශිෂ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවේ ටෙන්ඩර් ලේඛන 22 ක් සකස් කිරීමට□ උපදේශකවරුන්ට ගෙවූ රු.126,000ක මුදල විවිධ ආදායම් ගිණුමට හර කර තිබුණි

(ඇ) විද්‍යායතන පරිශ්‍රයේ තිබූ ගස් වලින් ඉරන ලද දැව තොගයේ වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි.

(ඉ) මධ්‍යම රජයේ ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් පවරා ගෙන තිබූ ආයුර්වේද රෝහලේ ස්ථාවර වත්කම් තවදුරටත් විද්‍යායතනයේ ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

1.2.3 **<u>නොසැසඳු වෙනස්කම්</u>**

ස්ථාවර වත්කම් ලේඛනයේ දක්වා ඇති වත්කම් වර්ග 08 ක 2009 දෙසැම්බර් 31 දිනට එකතුව වූ රු. 220,795,990 ක ශේෂයන් හා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ස්ථාවර වත්කම් උපලේඛනයෙහි එදිනට දැක්වෙන ශේෂයන් අතර රු. 141,425,745 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.2.4 **<u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>**

2010 දෙසැම්බර් 28, දිනැති අංක 1692 දරන වවුචරයෙන්, ආයතනය පිළිබඳ සමාලෝචන කමිටුවේ සාමාජිකයින් හට නවාතැන් හා රාත්‍රී භෝජන සංග්‍රහය වෙනුවෙන් රු.30,000 අත්තිකාරම් මුදලක් ගෙවා තිබූ අතර එම මුදල පියවීම 2010 දෙසැම්බර්30 දිනැතිව සිදු කර තිබූ නමුත් වියදමට අදාලව රිසිට්පත් ඉදිරිපත් කර නොතිබුණි.

1.2.5 **<u>නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.</u>**

පහත සඳහන් නීති,රීති,රෙගුලාසි වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **<u>නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව</u>** | **<u>අනුකූල නොවීම</u>** |
|---|---|
| අ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>මු.රෙ. 165 | වර්ෂ 5 කට වඩා පැරණි රු.78,555 ක් වූ මුදල් ඇණවුම් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් උපලබ්ධි වී නොතිබුණු අතර එම මුදල් අයකර ගැනීමට අවශ්‍ය පියවරගෙන නොතිබුණි. |
| ආ. අංක PED/12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | මූල්‍ය වර්ෂය ආරම්භ වීමට මාස 03 කට පෙර අයවැය ලේඛනය අනුමත කල යුතු වුවද සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය පිළියෙල කරන විට මූල්‍ය වර්ෂයෙන් මාස 10 ක් ඉකුත් වී තිබුණ බැවින් ආයතනය අයවැය පාලනයෙන් බැහැරවී තිබුණි |

2 **<u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.</u>**

2.1 **<u>මූල්‍ය සමාලෝචනය</u>**

2.1.1 **<u>මූල්‍ය ප්‍රතිඵල</u>**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විද්‍යායතනයේ වැඩකටයුතුවල ප්‍රතිඵලය රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.100,753, 823 ක ඌනතාවයක් වූ අතර , ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.93,077,141 ක් විය. සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබී තිබුණු රු.89,525.000 ක් වූ රජයේ ප්‍රදානය ගණන් ගත් පසු එම ඌනතාවය රු.11,228,823 දක්වා අඩුවී තිබුණු අතර□ ඉකුත් වර්ෂය වෙනුවෙන් පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබී තිබූ රු. 86.000,000 ක ප්‍රදානය හේතු කොට ගෙන එම වර්ෂයේ ඌනතාවය රු. 7,077,141 ක් දක්වා අඩු වී තිබුණි.

2.2 **<u>මෙහෙයුම් සමාලෝචනය</u>**

2.2.1 **<u>කාර්යසාධනය.</u>**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**අ. අධ්‍යයන කාර්යසාධනය**

2009/2010 අධ්‍යයන වර්ෂයේ විද්‍යායතනයේ ලියාපදිංචි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 151 ක් වන අතර ඉන් සිසුන් 08 දෙනෙකු වෙනත් විශ්වවිද්‍යාල වලට මාරු කර යවා ඇති අතර සිසුන් 25 දෙනෙකු පාඨමාලාව හැර ගොස් තිබුණි. මේ අනුව වර්ෂය අවසාන වන විට විද්‍යායතනයේ අධ්‍යාපනය හදාරමින් සිටි නවක සිසුන් සංඛ්‍යාව 118 ක් හෙවත් ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 78% ක් විය. ඒ අනුව විද්‍යායතනයේ සම්පත් ඌන උපයෝජිත බව නිරීක්ෂණය විය.

**ආ. විභාග ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ පැවැත්වූ විභාග සඳහා පෙනී සිටි සිසුන් 170 කින් විභාග සමත් සිසුන් සංඛ්‍යාව 107 ක් එනම් 63% ක් වූ අතර ඌන සමත් සිසුන සංඛ්‍යාව 56 ක් එනම් 33% ක් බව නිරීක්ෂණය විය.

**ඇ. විෂය නිර්දේශ සංශෝධනය**

2001 වර්ෂයේ සිට පවත්වාගෙන යනු ලබන ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධි පාඨමාලාවේ විෂය නිර්දේශය හා විභාග නිර්නායක ගුණාත්මක හා ව්‍යුහාත්මක වර්ධනයක් උදෙසා සංශෝධනය කිරීම සඳහා 2005 වර්ෂයේදී කමිටුවක් පත්කර ඇතත්, 2011 මාර්තු 30 දින වන විටත් එම කාර්යය අවසන් කර නොතිබුණි.

2.2.2 **<u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>**

මසකට රු.31,000 ක පිරිවැයක් දරමින් 128 kbps ධාරිතාවයක් ඇති අන්තර්ජාල සබඳතාවක් භාවිතා කරනු ලබන අතර එහි ධාරිතාවය ආයතනයට ප්‍රමාණවත් නොවීම නිසා අන්තර්ජාලයට ඇතුළුවීමට සිසුන්ට බොහෝ වේලා රැඳී සිටීමට සිදුවීමෙන් ඔවුන් අපහසුතාවට පත්වන බව නිරීක්ෂණය විය.

2.2.3 **<u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

අ. රු.824,000 ක පිරිවැයකට බාහිර පාර්ශවයක් විසින් පිළයෙල කරන ලද පරිගණක පද්ධතිගත කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් සමාලෝචිත වර්ෂයේ දී ආයතනයට භාරදී තිබුණද ලේඛනය ලැබීමෙන් පසු වර්ෂය තුල අත්පත්කරගත් ප්‍රාග්ධන වත්කම් ඇතුලත් කර එය යාවත්කාලීන කර නොතිබුණි. එකම රහස් යතුරකින් මෙම ලේඛනය කියවීමට හා තොරතුරු ඇතුලත් කිරීමට හැකිවීමෙන් මෙම ලේඛනයේ ආරක්ෂාව හා නිවැරදිතාවය පිළිබඳ අභ්‍යන්තර පාලනයේ දුර්වලතාවයක් පැවතීම, කේත අංක අනුව වත්කම් ගිණුමට පිවිසීමට නොහැකි වීම , වත්කම් පවතින ස්ථානය වෙනස් කිරීමේදී එය ඇතුලත් කර නොගැනීම නිසා නව ස්ථානය හඳුනාගැනීමට නොහැකිවීම යනාදී කරුණු හේතුවෙන් වත්කම් පිළිබඳ අභ්‍යන්තර පාලනය දුර්වල වී තිබුණි.

ස්ථාවර වත්කම් ලේඛණය පිළියෙල කිරීමේදී පුස්තකාල පොත් භෞතිකව පරීක්ෂා කොට නොතිබූ අතර පරිග්‍රහන ලේඛණයේ දැක්වෙන ආකාරයට ස්ථාවර වත්කම් ලේඛණයට ඇතුලත් කර තිබුණි. පුස්තකාල පොත් ස්ථාවර වත්කම් ලේඛණයට ඇතුලත් කිරීම පිළිබඳ නියැදි පරීක්ෂාවේදී පරිග්‍රහන ලේඛණයේ දැක්වෙන මිල ගණන් හා ස්ථාවර වත්කම් ලේඛණයේ දැක්වෙන මිල ගණන් අතර රු.3,460 සිට රු.43,000 දක්වා නොසැසඳීම් නිරීක්ෂණය විය.

ආ. ශරීර ඒකකයේ මෘතදේහ සීරු මාරු කිරීම, මෘතදේහ සංරක්ෂණය, ශරීර කොටස් එකලස් කිරීම හා පවිත්‍රතා කටයුතු සඳහා අවශ්‍යවූ කම්කරු තනතුරු දෙකක් වසර දෙකකට වැඩි කාලයක සිට පුරප්පාඩුව පැවතුනි.

## 2.2.4 **කොන්ත්‍රාත් පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

අ. වතුපිටිවල ඖෂධ උද්‍යානය වටා කම්බි වැටක් ඉදිකිරීම වෙනුවෙන් පිලියෙල කරන ලද රු. 1,986,650 ක් වූ මුළු පිරිවැය ඇස්තමේන්තුව සඳහා වැඩ ඉංජිනේරුවරයාගේ සහ කලමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. මෙම කාර්යය සඳහා වරින් වර මිල ගණන් කැඳවා කොටස් වශයෙන් ද්‍රව්‍ය මිලදී ගෙන තිබූ අතර එම මිලදී ගැනීම් සඳහා ප්‍රසම්පාදන මණ්ඩලයේ හා තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ ලබාගෙන නොතිබුණි. මේ වෙනුවෙන් වැයකරන ලද රු.1,129,491 ක් සඳහා මුදල් කමිටුවේ අනුමැතිය ද ලබාගෙන නොතිබුණි.

ආ. පහල වීදියවත්ත සේවක නිල නිවාසය අළුත්වැඩියා කිරීම සඳහා රු.223,608 ක් පිරිවැය වූ ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණි. එම ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කර තිබූ අතර මිලදී ගත් ද්‍රව්‍ය අතර රු 158,118 ක කොන්ක්‍රීට් නිෂ්පාදන අදාල නිෂ්පාදිත ආයතනයෙන් මිල දී නොගෙන එම නිෂ්පාදනයම වෙනත් ආයතනයකින් මිලදී ගෙන තිබුණි.

ඇ. රස හෙසජ්‍ය ඒකකයේ ඖෂධ ගබඩාවේ රාක්ක සවිකිරීම සඳහා අවශ්‍යතාවය පෙන්වා දී වසර දෙකකට පසුව මිල ගණන් කැඳවා තිබූ අතර එම මිල ගණන් තාක්ෂණික ඇගයීම් කමිටුවකට ඉදිරිපත් කර නිර්දේශ ලබාගෙන නොතිබුණි. අවම මිල පදනම් කරගෙන වැඩ අධිකාරී විසින් කරන ලද නිර්දේශය මත තෝරාගත් සැපයුම්කරු දැව ඉරුම්කරුවකු හෝ අලෙවිකරුවකු නොවූ අතර එම සැපයුම්කරුට කොස් දැව ප්‍රවාහනය සඳහා බලපත්‍ර ලබාගැනීමට නොහැකිව පිරිවිතරයට අනුව දැව සපයා නොතිබුණි. එම කාර්යය ඉටු කිරීම සඳහා මේ දක්වා විකල්ප ක්‍රියාමාර්ගයක්ද ගෙන නොතිබුණි.

## 2.2.5 **ඒක ශිෂ්‍ය පිරිවැය**

අධ්‍යයන, පරිපාලන හා මූල්‍ය යනුවෙන් සමාලෝචිත වර්ෂය තුල වැය කල මුළු වියදම රු.107,379,657 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යයන කටයුතු වල නිරත මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 334 ක් වූයෙන් වර්ෂය සඳහා ඒක ශිෂ්‍ය සාමාන්‍ය පිරිවැය රු. 321,496 ක් විය.

## 2.2.6 **ඌන උපයෝජිත වත්කම්**

සමාලෝචිත වර්ෂය තුල බැංකු ජංගම ගිණුමේ පැවති අවම ශේෂය රු.18,082,243ක් ව බැවින් අතිරික්ත මුදල් ආයෝජනය කරීමකින් තොරව ජංගම ගිණුමේ රඳවාගෙන තබූ බව නිරීක්ෂණය විය.

2.2.7 **<u>පුස්තකාල පරිපාලනය</u>**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

අ. විද්‍යායතනයේ පුස්තකාල පොත් 1993 වර්ෂයේදී අවසන් වරට සමීක්ෂණය කර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට වර්ෂ 17 ක් ඉකුත්වී ඇති බැවින් පරිග්‍රහන ලේඛනයේ දැක්වෙන පුස්තකාල පොත්වල නිවැරදතාවය තහවුරු වී නොතිබුණි.

ආ. ශිෂ්‍යයින් වෙත බැහැරදෙන ලද පොත් වලින් රු.123,674 ක් වටිනාකම වූ පොත් 229 ක්ද, කාර්ය මණ්ඩලය වෙත බැහැර දෙන ලද පොත් වලින් රු.20,915 ක් වටිනාකම වූ පොත් 35 ක්ද, දීර්සකාලයක සිට ආපසු භාරදී නොතිබුණි

3. **<u>පද්ධති හා පාලන</u>**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විද්‍යායතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට වරින් වර යොමුකරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) කොන්ත්‍රාත් පරිපාලනය

(ආ) වාහන පාලනය

(ඇ) ගබඩා පාලනය

(ඈ) පුස්තකාල පරිපාලනය

(ඉ) ස්ථාවර වත්කම්